ලංකා පොස්පේට් සමාගම - 2021
----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මතය
------

ලංකා පොස්පේට් සමාගමේ (“සමාගම”) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම
------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට/ අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.71,447,853ක් වූ ණයගැති ශේෂය තුළ වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ වසර 3කට වැඩි කාලයක සිට හා එප්පාවල පොස්පේට් සමාගමේ වසර 6කට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.1,487,567ක හා රු.10,100,566ක ණයගැති ශේෂයන් පැවති අතර මෙම ණය ශේෂයන් අයකර ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. මෙම ණයගැති ශේෂයට වර්ෂ කිහිපයක සිට පැවත එන රු.550,000 ක බැර ශේෂ හා 2005 වර්ෂයේ සිට පැවත එන මුදලට විකුණුම් රු.2,475,958 ක ශේෂයන් ඇතුළත් කර තිබුණි. මෙම බැර ශේෂ හා ඉහත සඳහන් මුදලට විකුණුම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට ආයතනය අපොහොසත් විය. | ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම හා එම ශේෂයන් පිළිබඳ දැනුවත් පුද්ගලයින් දැනට ආයතනය තුල නොමැති වීම යන කරුණු නිසා එම ශේෂ තවමත් නිරවුල් කර ගැනීමට නොහැකි වී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කොට මෙම ශේෂ නිරවුල් කිරීමට සුදුසු තීරණයක් 2021/22 ගිණුම් වර්ෂ තුළ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙමි. | දීර්ඝ කාලයක සිට පවතින බැර ශේෂයන් නිරවුල් කිරීමට හා අදාළ ණයගැති ශේෂය අයකර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 150,582,469ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 13,480,162 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.137,102,307 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට "එප්පාවල රොක් පොස්පේට්" (ERP) ආදායම රු. 210,394,575 කින් ඉහල යෑම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

| අනුපාත | 2019/2020 | 2020/2021 |
|---|---|---|
| ජංගම අනුපාතය | 15:1 | 10:1 |
| ක්ෂණික අනුපාතය | 12:1 | 8:1 |
| දළ ලාභ අනුපාතය | 37% | 46% |

ස්ථාවර තැන්පත්වල ආයෝජනය වැඩිවීම හේතුවෙන් ජංගම අනුපාතය ඉහල අගයක් ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලාභයද ස්ථාවර තැන්පත්වල ආයෝජනය කිරීම නිසා ජංගම වත්කම් පෙර වර්ෂයට වඩා ඉහල ගොස් තිබුණි. නමුත් උපචිත වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම හේතුවෙන් ජංගම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 14 දින ආරම්භ කරන ලද පොල් පොහොර ව්‍යාපෘතිය සඳහා රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණ අතර ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව රු. මිලියන 72 ක පොල් පොහොර ආදායමක්, රු.මිලියන 10 ක ශුද්ධ ලාභයක් හා වාර්ෂිකව ආදායම සියයට 10 කින් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. තවද පොල් පොහොර වෙළඳපලෙන් සියයට 10ක වෙළඳපල කොටසක් අත්පත් කර ගැනීම දිගුකාලීන අරමුණ වී තිබුණි. එසේ වුවද 2020 මැයි සිට නොවැම්බර් දක්වා ව්‍යාපෘතියට අමුද්‍රව්‍ය ලබා නොදීම මත පොල් පොහොර නිෂ්පාදනය සිදුවී නොතිබුණු අතර 2020 දෙසැම්බර් සිට 2021 මාර්තු කාලය තුල පොහොර නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලැබීම නිසා පොහොර නිෂ්පාදනය හා අලෙවියද ඉහළ ගොස් තිබුණි. | කාලීනව සිදු වූ වෙළඳපල වෙනස් වීම්, රජයේ පොහොර ප්‍රතිපත්ති වෙනස් වීම් හා ආයතනික පරිපාලන තීරණයන් අනුව විවිධ ප්‍රතිඵලයන් යටතේ ක්‍රියාත්මක වූ නමුදු 2020 දෙසැම්බර් මස සිට විධිමත් ක්‍රමවේදයක් අනුව සාධාරණ ලාභයක් ලබන මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබුවද , 2021 අප්‍රේල් මස සිට සිදුවුනු රසායනික පොහොර භාවිතය සීමා කිරීමත් සමඟ ඇණ හිට ඇත. | රු.මිලියන 21 කට අධික ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද පොල් පොහොර ව්‍යාපෘතිය ක්‍රියාකාරී හා ඵලදායී මට්ටමට ගෙන ඒමට ක්‍රමවේද සකස් කළ යුතුය. |

### 3.2 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2011 වර්ෂයේදී චීනයේ පුද්ගලික ආයතනයකින් මිලදී ගන්නා ලද 6 Roller (TGM 160) මිල් යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් සැපයීමට නම් රු. 43,435,115ක වටිනාකමින් යුතු 6 Roller (TGM 160) නව මිල් ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගත යුතුය යන කොන්දේසිය මත චීනයේ වෙනත් පුද්ගලික ආයතනයකින් 2014 වර්ෂයේදී මිලදී ගත් නව මිල් යන්ත්‍රයේ රු.11,513,434 ක් වූ මිල් පාදම කොටස, 2014 – 2016 අතර කාලය තුල මිල් යන්ත්‍ර සඳහා මිලදී ගත් රු.14,290,237 ක අමතර කොටස් හා මෙම මිල් යන්ත්‍රය ස්ථාපිත | වෙළඳපල තුල සිදුවූ ඉල්ලුමේ වෙනස්කම් හා දේශපාලනමය වෙනස් වීම් මත සවි කිරීම ප්‍රමාද වූ අතර මේ වන විට එම ස්ථාපන කටයුතු නැවතත් අරම්භ කොට ඇත. 2022 ජනවාරි මස වන විට නිෂ්පාදන කටයුතු සඳහා යොදවා ගැනීමට සැලසුම් කොට ඇත. | යන්ත්‍ර කොටස් ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳ සැලකිලිමත්ව කටයුතු නොකර අදාල යන්ත්‍ර කොටස් මිලදී ගැනීමට ක්‍රියාකර ඇති නිලධාරින්ට එරෙහිව ක්‍රියාකළ යුතු අතර හැකි ඉක්මනින් අදාළ යන්ත්‍ර කොටස් ස්ථාපිත කර |

| | | |
|---|---|---|
| කිරීම සඳහා නොනිමි වැඩ ලෙස පෙන්වා ඇති රු.7,440,000 ක ඉදිකිරීමද 2021 ජූලි 30 දින දක්වා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පැවතිණි. | | ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. |
| (ආ) ඉහල යන පොහොර ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි පොහොර සැපයීමට හා පොහොර ආනයන වියදම අඩුකර ගැනීමේ අරමුණින් රු.34,654,178 කට පාවිච්චි කරන ලද ක්‍රෂර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර එම යන්ත්‍රයේ කිසිම කොටසක යන්ත්‍රයේ වර්ගය, මාදිලිය, නිෂ්පාදන සමාගම හෝ නිෂ්පාදිත රට පිළිබඳව තොරතුරු අඩංගු නොවන බව එවකට සිටි නිෂ්පාදන කළමණාකරු විසින් ලිඛිතව ඡායාරූපමය සාක්ෂි සහිතව, සාමාන්‍යාධිකාරිට දැනුම් දී තිබුණි. එම යන්ත්‍රය ස්ථාපිත දින සිට 2021 ජූලි 30 දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. තවද නව ක්‍රෂර් යන්ත්‍රයක් වෙනුවට පාවිච්චි කරන ලද යන්ත්‍රයක් මිලදී ගැනීමෙන් පොස්පේට් සමාගමට සිදුවී ඇති අලාභය හා අදාල යන්ත්‍රය භාවිතයට නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගෙන ඔවුන් සම්බන්ධයෙන් සමාගමේ බලධාරීන් කටයුතු කර නොතිබුණි. එසේම මෙම යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අනාරක්ෂිතව තැබීම නිසා මේ වන විට යන්ත්‍රය විනාශ වී තිබුණු බව නිරීක්ෂණය විය. | වර්තමානය වන විට මෙම ක්‍රෂර් යන්ත්‍රය අළුත්වැඩියා කොට නැවත නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් කොට ඇත. අවශ්‍ය තාක්ෂණිකමය නිර්දේශ ලබා ගැනීමට උතුරු මැද පළාත් සභාවේ පළාත් ඉංජිනේරු මහතුන්ගේ සහාය ලබා ගෙන ඇති අතර, එම නිර්දේශ මත කඩිනමින් අවශ්‍ය නවීකරණ කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | රු. මිලියන 34 කට වැඩි මුදලක් වැයකර මිලදීගෙන ඇති යන්ත්‍රය ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. |
| (ඇ) 2019 ජනවාරි 07 දින සිට ධාවනයෙන් ඉවත් කර වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ ඩබල් කැබ් රථය 2021 නොවැම්බර් 10 දින වන විටත් වෙන්දේසි කිරීමට හෝ ධාවනය සඳහා යොදාගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්තමාන වාහන වෙළඳපල තුළ පවත්නා තත්ත්වය හා සීමාවන් නිසා මෙම වාහන ඉවත් කිරීමේ කටයුතු ප්‍රමාද කිරීමට සිදුවී ඇති අතර නව තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් පසු පුවත්පත් දැන්වීමක් හරහා මෙය ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | අළුත්වැඩියා කර ධාවනය සඳහා යොදා ගැනීමට හෝ අදාල අනුමැතීන් සහිතව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) 2016, 2017, 2018 වර්ෂයන් වල සිට පැවත එන රු.3,808,331 ක යල් පිනූ තොග ඉවත් කිරීම සඳහා විගණන දිනය වන විටත් සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | අවස්ථා කිහිපයකදීම මෙම කොටස් ඉවත් කිරීමට දැන්වීම් පළ කළද ,ඒ සඳහා ප්‍රමාණවත් ඉල්ලීම් ඉදිරිපත් නොවීම නිසා ඉවත් කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. | ඉවත් කිරීමේ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ හා වෙනත් යන්ත්‍ර කොටස් යන්ත්‍රාගාර පරිශ්‍රයේ තැනින් තැන අනාරක්ෂිතව දමා තිබූ අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල පුවත්පත් දැන්වීම 2021 දෙසැම්බර් මස වන විට පළ කර ටෙන්ඩර් ක්‍රමවේදය හරහා ඉවත් කිරීමට කටයුතු සංවිධානය කොට ඇත. | ඉවත් කිරීමේ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |

### 3. 3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කම්කරු තනතුරු එකක්ද, දෛනික පදනම මත සේවකයන් 29 ක්ද, වතු සහායක තනතුරේ 03 ක්ද බඳවාගෙන තිබුණි. | ආයතනයේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සේවක මහතුන් දෛනික පදනම මත සේවයට කැඳවා ඇති නමුත්, ආයතනයේ සේවක සැළැස්මේ හා බඳවා ගැනීමේ පරිපාටියේ පවතින සීමාවන් නිසා ඉහත සේවක මහතුන් ස්ථිර වශයෙන්, ආයතනයට බඳවා ගැනීමට මේ වන විට ද කටයුතු කොට නොමැති බව දන්වා සිටිමි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පත්වීම් ලබාදීමට කටයුතු නොකළ යුතුය. |